අඹගමුව ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 27 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

2009 වර්ෂයේ පළාත් පාලන සතියේදී රණවිරු පවුල් 03ක දරුවන් තිදෙනෙකුට රු.1,500ක් බැගින් ශිෂ්‍යත්ව ලබාදීමේ ව්‍යාපෘතියක් ආරම්භකර තිබූ අතර, මේ සඳහා අනුග්‍රහය ලබාදී තිබූ පෞද්ගලික සමාගමක් ගෙවීම් නවතා දැමීමෙන් පසු සභා අරමුදලින් ගෙවන ලද රු.45,000ක් අත්තිකාරම් ගිණුමේ ඉදිරියට ගෙන එමින් පැවැතුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.

---------------------------

සභාව මහජන බැංකුවේ පවත්වාගෙන යන සාමාන්‍ය ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.1,345,890ක් වුවද, බැංකු සැසඳුම හා සාරාංශ මුදල් පොත අනුව එය රු.1,246,511ක් වූයෙන් රු.99,379ක නොසැසඳීමක් විය.

1.3.3 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්.

----------------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්

--------------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 03ක එකතුව රු.101,388,827ක් වූ අතර, එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.45,810,644ක් වී තිබුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

---------------------

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 03ක එකතුව රු.147,191,188ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.66,856,374ක් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.95,636,764ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති රීති, හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලනය) රීති අංක 218 | සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව පරීක්ෂාකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරයේ මුදල් රෙගුලාසි 1646 | ආයතනයේ කිසිදු වාහනයක ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,479,851ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,185,941ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.11,293,910ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ). සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමඟ සැසඳීමේදී රු.11,293,910ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා ප්‍රභවයන් 05ක ආදායම් වැඩිවීම් හා විෂයයන් 05ක වියදම් අඩුවීම මූලික වශයෙන් හේතුවී තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.40,855,395 ක් ලැබී තිබුණු නමුත් වැටුප් හා දීමනා ලෙස රු.56,461,115 ක් ගෙවා තිබුණි. ඒ අනුව සභාවේ ආදායමෙන් රු.15,605,720 ක මුදලක් සභා සේවකයින්ගේ වැටුප් ගෙවීමට වැය කරතිබූ අතර, එම මුදල් වැටුප් ප්‍රතිපූර්ණය හැර සභාවේ පුනරාවර්තන ආදායමින් 28%ක් වී තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 0.8:1 ක් ලෙස ප්‍රශස්ථ මට්ටමේ නොපවතින අතර, සභාවේ ජංගම බැරකම් කෙටි කාලීනව ගෙවා දැමීමේ හැකියාව ඉතාමත් දුර්වල මට්ටමක පැවතුණි. ජංගම වත්කම්වලින් සියයට 77ක් කර්මාන්ත ණයගැතියන්ගෙන් සමන්විත වී තිබුණු අතර, සභාවේ මුදල් ශේෂය රු.2,654,869ක සෘණ අගයක් ගෙන තිබුණි. ජංගම වගකීම්වලින් 75%ක් කර්මාන්ත ණයහිමියන්ගෙන් සමන්විත විය.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2015.01.01 දිනට හිඟය | 2015.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2015 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2015.12.31 දිනට හිඟ 2015.01.01 දිනට පැවති හිඟයෙන් | වර්ෂයේ බිල්කිරීම් වලින් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 2,433,400 | 603,295 | 7,049,510 | 5,463,986 | 1,830,105 | 1,585,524 | 3,415,629 |
| බදු කුලී | 1,951,209 | 250,000 | 11,314,117 | 11,207,950 | 1,701,209 | 106,167 | 1,807,376 |
| වෙනත් | 4,720,994 | 632,599 | 1,511,905 | 952,958 | 4,088,395 | 558,947 | 4,647,342 |

ඉහත විස්තර අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ ආදායමින් සහ බිල්කිරීම් වලින් ආදායම් රැස්කර ගැනීමට කළමනාකාරිත්වය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

### 2.4.2 වරිපනම් බදු

වර්ෂය ආරම්භයේ පැවති හිඟයෙන් වර්ෂය තුලදී අයවීම් සියයට 24ක් පමණක් වූ අතර මෙම හිඟ මුදල් අයකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. වර්ෂය අවසානයේ පැවති හිඟයෙන් සියයට 18ක් හෙවත් රු.638,345ක් රජයේ දේපළවලින් අයවිය යුතු හිඟයක් විය.

### 2.4.3 බදු කුලී

වර්ෂයේ ආරම්භයේ පැවති හිඟයෙන් අයවීම් සියයට 12ක් වූ අතර වර්ෂය ආරම්භයේ පැවති මස් කඩ කුලී හිඟය වූ රු.1,616,786කින් කිසිදු මුදලක් වර්ෂය තුලදී අයකරගෙන නොතිබුණි.

### 2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2015 දෙසැම්බර් 31 දිනට රු.9,155,662ක මුද්දර ගාස්තු සහ රු. 1,460,895ක උසාවි දඩ අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). විශ්‍රාමගිය සේවකයින් 10 දෙනෙකුගෙන් හා සේවය අත්හිටවූ එක් අයෙකුගෙන් අයවිය යුතු රු.242,736ක ණය මුදල් අයනොවී ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 387 ප්‍රකාරව ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ගැනීම තහනම් වුවද, සභාවේ පවත්වාගෙන ගොස් තිබූ ජංගම ගිණුම් 03ක සෘණ ශේෂයන් ඇතිවන සේ ගෙවීම්කර තිබුණි.

(ඇ). සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ ට්‍රැක්ටරයක හා යතුරු පැදියක අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(අ). වැලිඔය ප්‍රජාශාලාව ඉදිකිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තුව අනුව වහල ඉදිකිරීම සඳහා මිලි මීටර් 62x62x6 ප්‍රමාණයේ L හැඩැති යකඩ පර්ලීන් යොදාගත යුතු වුවද, මිලි මීටර් 47x47x6 යකඩ පර්ලීන් යොදා තිබුණු අතර ඇස්තමේන්තුවේ සඳහන් රු.484,462ක මුළු මුදලම ගෙවා තිබූ බව 2016 මැයි 03 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ).මස්කෙළිය ලක්ෂපාන පෙර පාසල ඉදිකිරීමේ කර්මාන්තයේ වර්ග මීටර් 37.6ක වඩිම්බු ලෑලි සවිකර නොතිබියදී ඒ වෙනුවෙන් රු.38,014ක මුදලක් ගෙවා තිබුණි බව 2016 මැයි 03 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අණාවරණය විය.

(ඇ).රිකාටන් කොම්පොස්ට් අංගණය ඉදිකිරීම් භූමියේ පැවති වට අඩි 2 ½ - 3 ½ ප්‍රමාණයේ ෆයිනස් ගස් 15ක් පමණ කපා ඉවත්කර තිබුණු අතර ඒවා රාජ්‍ය දැව සංස්ථාව විසින් කපා ඉවත්කරගෙන ගොස් ඇති බවට වාචිකව දන්වා සිටි නමුත් දැව සංස්ථාව වෙත අදාළ ගස් කපා ඉවත්කරගෙන යන ලෙසට දැනුම්දීමේ හෝ දැව සංස්ථාව විසින් ගස් කපා ඉවත්කර ගත් බවට කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. රිකාටන් කොම්පොස්ට් අංගණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ගෙබිම කොන්ක්‍රීට් කිරීමේදී සැලසුම් ප්‍රකාරව ප්‍රසාරණ මූට්ටු යොදා නොතිබුණි.

3.3 ව්‍යාපෘති ප්‍රමාද කිරීම.

----------------------

මරේ ප්‍රජා ශාලාව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා 2014 සැප්තැම්බර් 09 දින රු.2,930,773ක මුදලකට ගිවිසුමකට එළඹ තිබුණි. ඒ වෙනුවෙන් 2015 මැයි 15 දින වන විට රු.1,281,472ක අතුරු ගෙවීම් සිදුකර තිබුණද කොන්ත්‍රාත්කරු කර්මාන්තය අතහැරදමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණය මුදල්කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

------------------

පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 05ක සියයට 09 සිට සියයට 43 දක්වාද වියදම් විෂයයන් 07ක සියයට 03 සිට සියයට 68 දක්වාද විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ශීර්ෂයන් 03ක ඇස්තමේන්තුගත ආදායමින් රු.6,871,231ක් උපයා ගැනීමට සභාව සමත්වී නොතිබුණු අතර වැය ශීර්ෂ 02ක ඇස්තමේන්තුගත වියදම ඉක්මවා රු.2,860,916ක් වැයකර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 193 ප්‍රකාරව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන, පරිපූරක සමඟ සසඳා බලා එක් එක් අය/වැය විෂයයන්ගේ අතිරික්තතා/ ඌණතා පිළිබඳ කරුණු පැහැදිලිකිරීමේ ප්‍රකාශයන් පිළියෙලකර ඉදිරිපත්කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

--------------------------

සභාවේ භාවිතා කරනු ලබන පරිගණක 15ක්, ඡායා පිටපත් යන්ත්‍ර 02ක්, ඩිජිටල් කැමරාවක්, ෆැක්ස් යන්ත්‍රයක්, රූපවාහිනී යන්ත්‍රයක්, ඩුප්ලෝ යන්ත්‍රයක් හා ප්‍රින්ටර් 07ක් නිශ්චිතව හඳුනාගත හැකි පරිදි විස්තර සහිතව ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුළත්කර නොතිබුණි.

4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2 උප පරිච්ඡේද ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.4 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ණය ගැති හා ණය හිමි පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) තොග පාලනය

(ඊ) කොන්ත්‍රාත් පාලනය